# අධ්‍යාපන දර්ශනය

(ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් වෙනුවෙන් සකස් කළ පාඨ ග්‍රන්ථයකි)

ආචාර්ය. ඩබ්ලිව්. කේ. ඩී. කීර්තිරත්න

# අධ්‍යාපන දර්ශනය

(ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් වෙනුවෙන් සකස් කළ පාඨ ග්‍රන්ථයකි)


## ආචාර්ය. ඩබ්ලිව්. කේ. ඩී. කීර්තිරත්න

**ශාස්ත්‍රවේදී (විශේෂ) පේරාදෙණිය, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට) කොළඹ, ශාස්ත්‍රපති (විශිෂ්ට) බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, අධ්‍යාපනපති (ජාතික අධ්‍යාපන ආයතනය) දර්ශනපති (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) දර්ශනශූරි (චීනය)**



පශ්චාත් උපාධි අධ්‍යාපන පාඨමාලාව - සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - මිහින්තලේ

# පටුන


| | | |
|---|---|---|
| 01 | දර්ශනය විෂයයෙහි ආරම්භය හා විකාශය | 03-08 |
| 02 | දර්ශනවාදී ගුරු කුල | 08-13 |
| 03 | අධ්‍යාපන දාර්ශනිකයෝ | 14-30 |
| 04 | ආචාර්ය. සි. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නංගර | 31-34 |
| 05 | ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය | 35-44 |
| 06 | විෂයමාලාව | 45-55 |
| 07 | ගුරු භූමිකාව | 53-57 |
| 08 | යාවජීව අධ්‍යාපනය | 57-62 |

# පෙරවදන

අධ්‍යාපනය හා දර්ශනය එකම කාසියක දෙපැත්තක් වැනිය යන්න දර්ශනය විෂයයෙහි හා අධ්‍යාපන විද්‍යා විෂයයෙහි සබඳතාව පිළිබඳ කතා කිරීමේ දි පෙර සිට මතු කැරෙන අදහසකි. මෙකී විෂයයන් දෙක එදාමෙදාතුරු එකිනෙකට සම්බන්ධ වී ගොඩ නැගුණකි. දර්ශනය විෂයයෙන් තොරව අධ්‍යාපන විද්‍යාව විෂයයෙහි සංවර්ධනයක් ද අධ්‍යාපන විද්‍යාව විෂයයෙන් තොරව දර්ශන විෂයයෙහි සංවර්ධනයක් ද දැකිය නොහැකි තරම්ය. අධ්‍යාපන විද්‍යාව සම්බන්ධ මූලික උපාධිවලදී ද පශ්චාත් උපාධිවලදී ද ගුරු පුහුණු පාඨමාලාවලදී ද අධ්‍යාපන දර්ශනය විෂයය වෘත්තීය විෂයය ක්ෂේත්‍රය යටතේ උගන්වන්නේ මෙකරුණ නිසාවෙනි. එවැනිම අධ්‍යාපන ක්‍රියාවලිය මෙහෙයවන නිලධාරින් ද, අධ්‍යාපනවිද්‍යාව විෂයය උගන්වන කථිකාචාර්යවරු ද, ගුරු අධ්‍යාපනඥයින් ද, පංතිකාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු වල යෙදෙන ගුරුවරු ද අධ්‍යාපන දර්ශනය පිළිබඳ දැනුම යාවත්කාලීන කරගැනීම අගය කෙරෙන්නේ එම විෂය එතරම්ම පවත්නා අධ්‍යාපන ක්‍රියාවලියේ ඵලදායි බවට බලපාන හෙයිනි.

එහෙයින්, අධ්‍යාපන දර්ශනය විෂයය හා සම්බන්ධ මෙම පාඨ ග්‍රන්ථ ඉහත සඳහන් කළ ආකාරයට විශ්වවිද්‍යාලවල මුල් උපාධි සඳහවෙන් පශ්චාත් උපාධි සඳහා අධ්‍යාපන කටයුතු වල යෙදෙන විද්‍යාර්ථීන්ටත් ගුරු පුහුණු ආයතනවල පුහුණුවීමේ කටයුතුවල යෙදෙන ගුරු ශිෂ්‍යයින්ටත් දැනුම වර්ධනය කර ගැනීම සඳහා මෙන්ම විභාගවලින් සමත්වීම සඳහා අත්වැලක් ලැබෙන සේ සකස් කොට ඇත. එවැනිම අධ්‍යාපන ක්‍රියාවලිය මෙහෙයවන නිලධාරින්ට අධ්‍යාපන විද්‍යාව විෂය උගන්වන කථිකාචාර්යවරුන් ගුරුඅධ්‍යාපනඥයිනට මෙන්ම පාසල් පද්ධතියේ සිටින ගුරුවරුන්ට තම දැනුම යාවත්කාලීන කරගැනීමට ද මෙම කෘතියෙන් මගපෙන්වීමක් කරාවිය යන්න කතුවරයාගේ හැඟීමයි.

අධ්‍යාපන දර්ශනය විෂයයට මඟ පෙන්වීමක් ලෙස සකස් කරන ලද මෙම කෘතියෙහි මුල් පරිච්ඡේදය දර්ශනය විෂය හා එහි ස්වභාවට පිළිබඳවත් අධ්‍යාපන දර්ශනය යනු කුමක්ද යන්නත් අධ්‍යාපන දර්ශනය හැදැරීමෙන් ගුරුවරයාට ලැබෙන ප්‍රයෝජන පිළිබඳවත් සාකච්ඡා කොට ඇත. දෙවන පරිච්ඡේදයේ දී දර්ශන විෂයය හා සම්බන්ධ ගුරුකුල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ. අධ්‍යාපනය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ දාර්ශනිකයින් පිළිබඳ තොරතුරු තුන්වන පරිච්ඡේදයේ දැක්වේ. සිව්වන පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට සුවිශාල මෙහෙයක් කළ ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමාගෙන් සිදු වූ සේවය පිළිබඳ සාකච්ඡා කොට ඇත. පස්වන පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ

අධ්‍යාපන පද්ධතියේ සංයුතිය ගැන කරුණු ඉදිරිපත් කොට ඇත. විෂයමාලාව එහි ස්වභාවය, විෂයමාලවර්ග යනාදිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා හයවන පරිච්ඡේදය වෙන් කොට ඇත. ගුරුභූමිකාව පිළිබඳවත් එහි ස්වභාවය හා 21 වන සියවසයේ ගුරුවරියාගේ භූමිකාවේ ස්වභාවය පිළිබඳවත් හත්වන පරිච්ඡේදය යටතේ විමසා බැලෙනු ඇත. යාවජීව අධ්‍යාපනය හා එහි ස්වභාවය පිළිබඳ අටවන පරිච්ඡේදයේ දී සාකච්ඡා කරයි.

මෙම අත්පොත සැකසීමේදී ඒ සඳහා නන් අයුරින් සහයදුන් පිරිස් බොහොමයකි. ඒ අතරින් රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති ආචාර්ය අනන්ද කරුණාරත්න මැතිතුමාව ස්තුති පූර්වකව සිහිපත් කරමි. ඒ විශ්වවිද්‍යාල පරිසරය තුළ ශාස්ත්‍රීය කටයුතුවල යෙදීමට අවශ්‍ය ඉඩකඩ සලසා තිබීම වෙනුවෙනි. දෙවනුව, කවදත් අපට ශාස්ත්‍රිය කටයුතු සඳහා දිරිගන්වන හා අවශ්‍ය උපදෙස් සපයන සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි මැතිතුමාවත් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. තවද මාගේ ශාස්ත්‍රිය කටයුතුවල දී නිබඳ සෙවනැල්ලක් වන බිරිඳ අමිලාව ත් පුතු විනුත්ව ත්, දියණිය සයුමිදිව ත් අනේකාරයෙන් දක්වන ලද උදව් උපකාර වෙනුවෙන් සිහිපත් නොකළහොත් එය විශාල අඩුවක් ලෙස හැගිමි. මෙවැනි කටයුතු වල දී තවදත් මා දිරිගන්වන රජරට විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර අධ්‍යයන අංශයේ අධ්‍යාපන විද්‍යාව පිළිබඳ ජෙෂ්ඨ කථිකාචාර්ය බී. එම්. එස් බණ්ඩාර මැතිතුමාව ද ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම කෘතිය යතුරු ලියනය කරමින් සහාය දැක් වූ අලෝකා, සුවිනි, නිකේෂලා, ලක්ෂානි යන මෙනවියන් සිව්දෙනාටත් කරන ලද සුවිශේෂි දායකත්වය වෙනුවෙන් ස්තුති කළ යුතුමය. පොතෙහි පිටකවරය සකස්කරමින් මුද්‍රණ කටයුතු  වලට ගැලපෙන ලෙස සූදානම් කළ අම්පාර බන්ඩාරනායක බාළිකා ජාතික පාසලේ ආචාර්ය කුසල් සංජීව විජේනායක මහතාවත් සතුටින් සිහිපත් කරමි. අවසාන වශයෙන් පොත මුද්‍රණය කිරීමේ කාර්යභාරගෙන එම කාර්ය සාර්ථකව ඉටුකළ කේ. නෙත්වින් පින්ටර්ස් අධිපති තුමා ඇතුලු සැමවත් ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ආචාර්ය ඩබ්ලිව්. කේ. ඩී කීර්තිරත්න
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලය
13. 01. 2021